Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

බාහිර දේශක / උපදේශක සඳහා බාහිර සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම - 2021 අධ්‍යයන වර්ෂය

මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාලවල බාහිර / උපදේශක තනතුරු සඳහා බාහිර සම්පත් දායකයින් ලියාපදිංචි කිරීමට මෙම නිවේදනය අවසානයේ දක්වා තිබෙන තාක්ෂණ විද්‍යාලවල /කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂවරුන් / විදුහල්පතිවරුන් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාලවල බාහිර පදනම මත දේශන පැවැත්වීමට නියමිතව තිබෙන විෂයයන් පිළිබඳ විස්තර සහ ආදර්ශ අයදුම්පත්‍රය තමා සේවය කිරීමට අදහස් කරන තාක්ෂණ විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත (9" X 4"ප්‍රමාණයේ) තම ලිපිනය සහ මුද්දර ඇලවූ ලියුම් කවරයක් යැවීමෙන් ලබාගත හැකි වේ. ඔබ එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ " බාහිර සම්පත් දායකයින්" යනුවෙන් සඳහන් කරන්න. නොඑසේ නම් අදාල තාක්ෂණ විද්‍යාලවලට / කාර්මික විද්‍යාලවලට පැමිණ මෙම විස්තර ලබාගත හැක.

03. මෙම විස්තර පත්‍රිකා සහ ආදර්ශ අයදුම්පත්‍ර ලබාගත හැකි අවසාන දිනය 2021.01.15 වැනි දින වේ. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2021.02.05 වේ.

04. අපේක්ෂකයින් සඳහා පොදු විස්තර :

I. අපේක්ෂකයින් විසින් තම අධ්‍යාපන, වෘත්තීය හා කාර්මික අංශයේ ලබා ඇති සුදුසුකම් හා අදාල විෂයයන් ඉගැන්වීමේ හෝ අදාල ක්ෂේත්‍රයේ කටයුතු කිරීමේ පලපුරුද්ද පිළිබඳ සියලුම විස්තර අයදුම්පත යැවීමේදී පැහැදිලිව සඳහන් කිරීමට වගබලා ගත යුතුවේ.

II. ගාස්තු ගෙවීම :
බාහිර සම්පත් දායකයින්හට ගෙවන ගාස්තුව ඔවුන්ගේ අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා පාඨමාලාවේ මට්ටම් අනුව පැයකට රු. 500/= සිට රු.1,000/= දක්වා වෙනස් වනු ඇත.

III. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම :
රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ තම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා මගිනි. මෙවැනි අපේක්ෂකයෙක් මෙම බාහිර උපදේශක කාර්යය සඳහා තෝරාගතහොත් එලෙස සේවයේ යෙදීම නිසා සිය රාජකාරී කටයුතුවලට බාධා නොවන බවට තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරවා ගැනීමට අපේක්ෂකයා විසින් වගබලා ගත යුතු වේ.

IV. තෝරා ගැනීම :
ලියාපදිංචිය සඳහා තෝරා ගනු ලබන්නේ අදාල තාක්ෂණ විද්‍යාලයේ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමෙන් පසුවය. තෝරා ගැනීමේ දී, අදාල විෂයයන් ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින් හට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයෙකුගේ බාහිර උපදේශක පත්වීම විද්‍යාලයේ අවශ්‍යතාව අනුව ලිඛිතව නිසි හේතු දැක්වීමකින් පසුව අධ්‍යයන වර්ෂය තුළ ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට අධ්‍යක්ෂ / විදුහල්පතිට හැකි බවද සැලකිය යුතුවේ.

V. මෙලෙස ලියාපදිංචි වන බාහිර සම්පත්දායකයින් තමා ඉගැන්වීම් සිදුකරන තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි වර්ෂ අවසාන / අභ්‍යන්තර විභාග කටයුතු සඳහා කිසිදු අමතර ගාස්තුවක් නොමැතිව සහභාගී විය යුතු වේ.

05. මෙම ලියාපදිංචිය 2021 අධ්‍යයන වර්ෂය සඳහා පමණක් වන අතර, කිසිදු ස්ථිර තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොමැත.

06. ඉල්ලුම්පත්‍ර එවීමේදී, විෂයන් එකකට වඩා ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් විෂයය සඳහා වෙන වෙනම ඉල්ලුම් පත්‍ර එවිය යුතු වේ. මෙම සෑම අයදුම්පතක්ම තමා ඉගැන්වීම් සිදුකිරීමට අපේක්ෂාකරන තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන්/ විද්‍යුත් තැපෑල මඟින් ඔහු හෝ ඇය නියම කරනු ලබන දිනට පෙර ලැබෙන සේ යැවිය යුතු වේ.

පී. එන්. කේ. මලලසේකර,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.
ඕල්කොට් මාවත.
කොළඹ 10.
www.dtet.gov.lk

තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල ලැයිස්තුව.

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය | විද්‍යාලයේ දුරකථන අංකය හා ඊ මේල් ලිපිනය |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ | 011-2324177 slotmaradana@dtet.gov.lk |
| 02 | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල | ගාල්ල | 091-2234871 cotgalle@dtet.gov.lk |
| 03 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල, මහනුවර | මහනුවර | 081-2224063 cotkandy@dtet.gov.lk |
| 04 | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය | 021-2222358 cotjaffna@dtet.gov.lk |
| 05 | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල | 055-2222413 cotbadulla@dtet.gov.lk |

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය | විද්‍යාලයේ දුරකථන අංකය හා ඊ මේල් ලිපිනය |
|---|---|---|---|---|
| 06 | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය | 025-2222666 cotanuradhapura@dtet.gov.lk |
| 07 | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම පාර, කුරුණෑගල | කුරුණෑගල | 037-2223264 cotkurunegala@dtet.gov.lk |
| 08 | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉගිනියාගල පාර, අම්පාර | අම්පාර | 063-2223485 cotampara@dtet.gov.lk |
| 09 | රත්නපුරය තාක්ෂණ විද්‍යාලය | ෆාම් ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය | 045-2232390 cotratnapura@dtet.gov.lk |
| 10 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල | 035-2222441 tckegalle@dtet.gov.lk |
| 11 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලුපාර, රත්මලාන | කොළඹ | 011-2612877 tcratmalana@dtet.gov.lk |
| 12 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර | මාතර | 041-2222565 tcmatara@dtet.gov.lk |
| 13 | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ | අම්පාර | 067-2260086 tcsammanthurai@dtet.gov.lk |
| 14 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර | 034-2222325 tckalutara@dtet.gov.lk |
| 15 | වරකාපොල කාර්මික විද්‍යාලය | අඟුරුවැල්ල පාර, වරකාපොල | කෑගල්ල | 035-2267651 tcwarakapola@dtet.gov.lk |
| 16 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල | 037-2281181 tckuliyapitiya@dtet.gov.lk |
| 17 | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට | මහනුවර | 081-2499782 tcpathadumbara@dtet.gov.lk |
| 18 | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය | නුවරඑළිය | 052-2222658 tcnuwaraeliya@dtet.gov.lk |
| 19 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම | කොළඹ | 011-2855315 tchomagama@dtet.gov.lk |
| 20 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට | 047-2243229 tcbeliatta@dtet.gov.lk |
| 21 | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක | මහනුවර | 055-2257129 tchasalaka@dtet.gov.lk |
| 22 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ | 066-2284713 tcdambulla@dtet.gov.lk |
| 23 | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රිය පොළ පාර, වඳුරුව, බලපිටිය | ගාල්ල | 091-2258096 tcbalapitiya@dtet.gov.lk |
| 24 | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | කුරුණෑගල | 037-2267256 tcwariyapola@dtet.gov.lk |
| 25 | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්චන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව | 065-2246557 tcbatticaloa@dtet.gov.lk |
| 26 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල | බදුල්ල | 057-2222753 tcbandarawela@dtet.gov.lk |

| අනු අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය | විද්‍යාලයේ දුරකථන අංකය හා ඊ මේල් ලිපිනය |
|---|---|---|---|---|
| 27 | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල | මොණරාගල | 055-2276167<br>tcmoneragala@dtet.gov.lk |
| 28 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල | ගම්පහ | 033-2222132<br>tcgampaha@dtet.gov.lk |
| 29 | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 026-2223034<br>tctrincomalee@dtet.gov.lk |
| 30 | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය | අම්පාර | 027-2230117<br>tcdehiattakandiya@dtet.gov.lk |
| 31 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී. පාර, මාතලේ | මාතලේ | 066-2224196<br>tcmatale@dtet.gov.lk |
| 32 | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | හම්බන්තොට | 047-2237064<br>tcweerawila@dtet.gov.lk |
| 33 | මැදගම කාර්මික විද්‍යාලය | බිබිලේ පාර ,මැදගම | මොණරාගල | 055-2266113<br>tcmedagama@dtet.gov.lk |
| 34 | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව | පොළොන්නරුව | 027-2224428<br>tcpolonnaruwa@dtet.gov.lk |
| 35 | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නව නගරය, ඇඹිලිපිටිය | රත්නපුර | 047-2261037<br>tcembilipitiya@dtet.gov.lk |
| 36 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | වවුනියාව | 024-2223664<br>tcvavuniya@dtet.gov.lk |
| 37 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව. | අම්පාර | 067-2279326<br>tcakkaraipattu@dtet.gov.lk |
| 38 | ආණමඩුව කාර්මික විද්‍යාලය | නව ගත්තේගම පාර, ආණමඩුව. | පුත්තලම | 032-2263288<br>tcanamaduwa@dtet.gov.lk |
| 39 | මන්නාරම කාර්මික විද්‍යාලය | පන්නායි, වෙඩිඩුවන් හන්දිය, මඩුපාර | මන්නාරම | 023-3238532<br>tcmannar@dtet.gov.lk |